# <u>රුහුණ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා විදුලි කාර්මික තනතුර (කොන්ත්‍රාත් පදනම මත)</u>

**සුදුසුකම්:**

1. 8 වන ශ්‍රේණිය සමත්.
2. පහත සදහන් කරුණු පිළිබද නිපුණත්වයක් ලබා තිබිය යුතුය.

    - විදුලි කාර්මික දෝෂයන් හදුනා ගැනීම, විදුලි උපාංග, පරිණාමක ( ට්‍රාන්ස්ෆෝමර්) සහ සියලුම වර්ග විදුලි උපකරණ හා යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා කිරීම සහ එකලස් කිරීම, විදුලි රැහැන් සහ වයර් තෝරා ගැනීම හා ඒවා වර්ග කිරීම, මිණුම් උපකරණ හා ඒවායේ භාවිතය, විදුලි රැහැන් ඇදීමේ සහ සම්බන්ධ කිරීමේ විවිධ ක්‍රම,මනු ( මීටර්) සහ කුඩා පරිණාමක පරීක්ෂා කිරීම.
    - විද්‍යුත් පරිපථ හා අදාල සැලැස්ම වලට අදාල සටහන් අවබෝධ කර ගැනීමේ හා දළ සටහන් නිර්මාණය කිරීමේ හැකියාව.
    - විදුලි කාර්මිකයෙකු ලෙස අදාළ උපකරණ නිවැරදිව භාවිත කිරීමේ හැකියාව.

3. රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ආයතනයක විදුලි කාර්මිකයෙකු ලෙස වසර 2 කට නොඅඩු පළපුරුද්ද.

4. වයස - අවුරුදු 40 ට නොවැඩි.

5. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

කරුණාකර ඔබ විසින් සකස් කළ අයදුම්පතක් ජීව දත්ත පත්‍රිකාව සමඟ පහත ලිපිනයට යොමු කරන්න.

ලිපිනය :- සහකාර ලේඛකාධිකාරී,<br>
වෛද්‍ය පීඨය ,<br>
රුහුණ විශ්ව විද්‍යාලය,<br>
තැ.පෙ. අංක 70,<br>
ගාල්ල.

නැතහොත් 2025 මාර්තු 20 වන දින හෝ ඊට පෙර jobs@med.ruh.ac.lk වෙත යොමු කරන්න.

අයදුම්කරුවන් අතරින් තෝරා ගත් අයදුම්පත් හිමි අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.

වැටුප: මාසික දීමනාව රු. 52,715,00 වේ. (සියලු දීමනා ඇතුළත්ව)

**සහකාර ලේඛකාධිකාරී**<br>
වෛද්‍ය පීඨය<br>
2025.03.14